පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2018 (අගෝස්තු 2018)
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2018( August 2018 )

# ප්‍රායෝගික ව්‍යාකරණය සහ සිංහල භාෂා මුහුණුවර

# (Practical Grammer and Aspect of the Sinhala Language)

**SINE (101)**

**කාලය පැය තුනයි (03).**

එක් කොටසකින් ප්‍රශ්න **දෙකක්වත්** (02) ඇතුළත් වන සේ ප්‍රශ්න **පහකට** (05) පමණක් පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (08) අටකි.

---

## I කොටස

1. භාෂාත්මක සංදිග්ධතාව යනු කුමක්දැයි සනිදර්ශනව සාකච්ඡා කරන්න.

2. කුල, පන්ති හා සමාජ තරාතිරම් අනුව භාෂාවේ විවිධතා දක්නට ලැබෙන්නේදැයි විමර්ශනය කරන්න.

3. "සිංහලේ ඉහළ භාෂා ස්වරූපයේ ව්‍යාකරණාංග පහළ භාෂා ස්වරූපයේ දක්නට නැත" භාෂා ද්වීරූපතා සංකල්පය ද පහදමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

4. වෘත්තිමය විවිධතාව හා අනන්‍යතාව, භාෂා ව්‍යවහාරය හා වාක්කෝෂය මගින් පිළිබිඹු වන ආකාරය පැහැදිලි කරන්න.

## II කොටස

5. පහත දැක්වෙන ප්‍රකාශයන්හි අක්ෂර වින්‍යාසයේ සදොස් තැන් ඇතොත් නිදොස් කර ලියන්න.

   i. නලුවෙක් තිලියක හා වේදිකාවට ආවේය.
   ii. සථ්‍යය වසණ් කරන්ණේ කුහඹයින්ය.
   iii. කළින් කළට ඇතැම් රීථීන් වෙනස් වේ.
   iv. සීහලේ ප්‍රමානික උගතුන් විරළය.
   v. ගුඩ පරමාර්ත සමස්ථයම මර්ධනය කෙරින.

(අනෙක් පිට බලන්න)

vi. ජ්‍යෙස්ටයින්ට සියළුම කනිශ්ටයින් අවනත වීමෙන් පීටය වැසින.

vii. විබාග ප්‍රතිපල පමා වීම නිසා ශිස්‍යයෝ ගෝසා කලහ.

viii. සියළු පස්වාද් උපාදි ආදර්ස ප්‍රශ්න වැරදිය.

ix. තීක්ෂන බුද්ධියෙන් හෙබි ගවේශකයාගේ අබිලාස බිඳ වැටිණ.

x. දේශපාලනඥයින්ගේ විශ්මයජනක කතා විෂ්වාස කල නොහැක.

6. "විරාම ලක්ෂණ මගින් සිදුවන්නේ, විවිධ අර්ථාන්විත භාෂණ ප්‍රභේද සංකේත මගින් නිරූපණය වීමය" විමසන්න.

7. පහත දක්වෙන වැකිවල සදොස් තැන් ඇතොත්,

අ. ඒ කවරේදැයි හේතු දක්වමින් පැහැදිලි කරන්න.

ආ. සදොස් තැන් නිදොස් කොට, නැවත එම වාක්‍ය ලියා දක්වන්න.

i. මහාචාර්යතුමා ශිෂ්‍යයනට උගන්වති.

ii. "ගම්පෙරළිය" උත්සවයට විශාල පිරිසක් රැස්විය.

iii. වෛද්‍යවරයා වෛද්‍ය සිසුහු ලවා ලෙඩ්ඩු බලවති.

iv. මා නිර්භය නොවෙයි සමහරුන් කියති.

v. ජලධාරාවන් සොබා දහම අලංකාර කරයි යයි කවියන් පවසයි.

vi. අක්කා ද තෝ ද පොළට යති.

vii. ඔවුහු එහි යතත් අප නොයමු.

viii. උවසුවෝ සිල් රකින්නේ මෙත් වඩන්නේය.

ix. ඇතැමෙක් හොරුන්ට ඡන්දය දෙති.

x. සභා තොමෝ සතුටින් විසිර ගියහ.

8. 'සිංහල ලේඛන රීති සම්ප්‍රදාය' ආශ්‍රය කොට පහත සඳහන් ඡේදයෙහි පද බෙදා නැවත ලියා දක්වන්න.

මුල දී වියතුන් හැම දෙන ම වාගේ සිතුයේ මයුරයේ එන **අලගක්කෝණාර** ('නිශ්ශංක' යන උපපදය පද්‍ය ගත නො වූ නිසා) **වීර අලකේශ්වර** (පරණවිතාන- 111 වැන්නා) ය යනු වෙ නි. ඒ අනුව නම් **වීර අලකේශ්වර** ගේ බාල මල් **වීරබාහු** ඔහුගේ ම ඇපා වී ම නිරවද්‍ය ය. මයූර යෙහි එනු යේ ඔහු නොව, ඔහු ගේ මාමා වූ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නැගූ, **තෙවන වික්‍රමබාහු** සමයේ සිට මන්ත්‍රීශ්වර වූ ප්‍රථම **අලගක්කෝනාර ය. සගම** ලිපි යෙහි ද , ඔහු ගේ අනෙක් බාලසහෝදරයා ත් "මේ අලකේශ්වර දේව මන්ත්‍රී දෙබෑයන්" ය යි සඳහන් විය. නම නොකී ඇපා ඔවුන් ට සමකාලීන වූ අර්ථනායක ඇපාණන් බව ත් ඔහු අලකේශ්වර සහෝදරිය වූ **පද්මාවතී**ගේ සැමියා මෙන් ම මේ වීර **අලකේශ්වර** ගේ පියා ද වන බවත් යට කී මූලාශ්‍රය කිහිපයක සඳහන් ය. එසේ ම, ගම්පළ ශත්‍රුසිංහ කුංජර ආරාධිත **එළු අත්තනගලුවංශ යේ** ද ඔහු මෙසේ ද නම් කෙරේ.

(අනෙක් පිට බලන්න)

"ත්‍රිසිංහලාධීශ් වර නවරත්නාධි පති **භුවනෛකබාහු** නරේන්ද්‍රයා හට අග්‍රාමාත්‍ය වූ... වංචි පුර ප්‍රවර... ශ්‍රී ලංකාධීශ් වර **අලකේශ්වර** මන්ත්‍රීශ්වර යන් හා මේ මන්ත්‍රීශ්වරයාණන් ට සහෝදර වූ **අර්ථනායක** මන්ත්‍රීශ්වරයන් හා....."

මෙහි දී අර්ථනායක මන්ත්‍රීශ් වර මිස ඈපා යන්න නො ලැබෙන බව ඒ සමග පරණවිතාන මහතා සඳහන් කොට ඇත ත්, **අම්පිටිය පර්වත ලිපියෙ හි** තෙවන වික්‍රමබා රජු ගේ තුන් වන වර්ෂයෙ හි (1360) දී සෙංකඩගල (නාථ) දෙවියන් ට අම්පිටියේ මැද්දේගම ප්‍රදානය කිරීම සහතික කරගන්නේ ද"

(සෑම ප්‍රශනයකටම ලකුණු 20 බැගිනි.)